**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2021

අප්‍රේල් - 2024

# BMGT E3045 - සංකාර්ය කළමනාකරණය

ප්‍රශ්න සංඛ්‍යාව : අටයි (08) කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න **පහකට** (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න අංක 01**

අ) ප්‍රධාන සංකාර්ය කළමනාකරණ ශ්‍රිත මොනවාද? උදාහරණ දෙමින් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) ප්‍රායෝගික උදාහරණයක් දෙමින්, නිෂ්පාදන පද්ධති සංකල්පය එහි ඇති සංරචක ඇතුළුව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ) සංකාර්ය කළමනාකරණයේ අතීත පරිනාමයේ වර්ධනය විස්තර කරන්න. අවම වශයෙන් වර්ධන අවස්ථා 03 ක් සඳහා උදාහරණ ඔබේ පිළිතුරට එක් කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 02

CGK වානේ සමාගම විශාල ඉන්දියන් සමාගමක කොටසක් වන අතර, එහි නිෂ්පාදන පහසුකම් ශ්‍රී ලංකාවේ කොළඹ, ගාල්ල සහ නුවර යන නගරවල පිහිටුවා ඇත. ලංකාවේ ඇති සමහර වානේ නිෂ්පාදන මෙහෙයුම් සඳහා මෙම පහසුකම් ලබාගැනීම සිදු කරයි. CGK හි බොහෝ කර්මාන්තශාලා වානේ නිෂ්පාදිත නිෂ්පාදනය කිරීම සඳහා විශාල වශයෙන් යන්ත්‍ර සහ උපකරණ භාවිතා කරන බැවින් ඒවා ප්‍රාග්ධනිත (ප්‍රාග්ධනය බහුලව භාවිතා කරන) වේ. මෙසේ නිපදවන වානේ නිෂ්පාදිත අතර, වානේ තැටි, දඟර සහ වයර් බාර්ස් (wire bars) බහුල වේ. තත්ත්ව ආරක්ෂණ පියවරක් ලෙස නිෂ්පාදිත සිදු කිරීමේදී, කම්බි දඬු ස්වයංක්‍රීය පරීක්ෂණ ක්‍රියාවලියකට යටත් වේ. මෙහි ප්‍රමුඛ ප්‍රයෝජනය වන්නේ, නිෂ්පාදිත කාර්යක්ෂමතාවය වැඩි කිරීමයි. තවද සංගතතාවය සහ තත්ත්වය සහතික වීමද සිදුවේ. ඉහත සඳහන් කරුණුවලට අනුව පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

අ) නිෂ්පාදනය යන යෙදුමේ අර්ථය කුමක්ද?

(ලකුණු 05)

ආ) "CGK වානේ සමාගම තත්ත්වයෙන් යුතු අතරමැදි භාණ්ඩ විශාල වශයෙන් නිපදවයි". මෙහි අදහස කුමක්ද?

(ලකුණු 05)

ඇ) තත්ත්වයෙන් ඉහල භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී ශ්‍රම සූක්ෂම ක්‍රමයට (ශ්‍රමය භාවිතා කිරීම) වඩා ප්‍රාග්ධන සූක්ෂම (යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීම) ක්‍රමයේ ප්‍රතිලාභ මොනවාද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 03

අ) සංකාර්ය කළමනාකරණය තුල ධාරිතා සැලසුම් කිරීම යනු කුමක්ද?

(ලකුණු 05)

ආ) ධාරිතා සැලසුම් ක්‍රියාවලියේ ප්‍රධාන පියවරයන් කවරේද?

(ලකුණු 05)

ඇ) වීදුරු නිෂ්පාදන සමාගමක්, එහි ප්‍රමාද වූ ඇනවුම් සම්පූර්ණ කිරීමට ක්‍රියාවලි තුනක් පිළිබඳ අවධානය යොමුකර ඇත.

1. අතුරු කොන්ත්‍රාත්කරුවන් යොදාගැනීම.
2. අතිකාල අනුව නිෂ්පාදන පටන්ගැනීම.
3. නව පහසුකම් ඇතිකිරීම.

අනාගතයේදී ඇතිවිය හැකි ඉල්ලුම් තත්ත්වයන්, ඉහල, මධ්‍යම සහ පහලයාම මත නිවැරදි තේරීම රඳා පවතී. කළමනාකරණය විසින්, ඉල්ලුම් තත්ත්වයන්ට අදාල සම්භාවිතයන් සහ පිරිවැය විශ්ලේෂණයක ප්‍රතිඵල ලෙස අදාල ලාභ තත්ත්වයන් පහතින් දී ඇත.

| විකල්ප | ඉල්ලුම් තත්ත්වයන්ට අදාල ලාභය ('00000) | | |
|---|---|---|---|
| | පහළ | මධ්‍යම | ඉහල |
| සම්භාවිතාව | .1 | .5 | .4 |
| 1 | 10 | 50 | 50 |
| 2 | -20 | 60 | 100 |
| 3 | -150 | 20 | 200 |

1. තීරණ අවස්ථා සහ එහි සම්භාවිතා සහ ප්‍රතිඵලවල ලාභදායිත්වය ඇතුලත් කර තීරණ රුකක් අඳින්න.
2. තීරණ රුක භාවිතයෙන් වීදුරු නිෂ්පාදන සමාගම කුමක් තීරණය කළයුතුද යන්න සඳහන් කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 04

ඇ) ව්‍යාපාරයකට පුරෝකථනයක් අවශ්‍ය වන්නේ ඇයිද යන්න සඳහා උදාහරණ දෙකක් දෙන්න.

(ලකුණු 05)

ආ) පුරෝකථන දෝෂ පාලනය කිරීම වැදගත්වන්නේ ඇයිද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ) XYZ සමාගමේ මාසික විකුණුම් දත්ත පහත සඳහන් වේ.

| මාසය | සත්‍ය විකුණුම් |
|---|---|
| 1 | 56 |
| 2 | 76 |
| 3 | 58 |
| 4 | 67 |
| 5 | 75 |
| 6 | 76 |

ඔබ විසින්,

(i) ත්‍රෛයිමාසික චල මධ්‍යනය ක්‍රමය භාවිතයෙන් 4, 5, 6 සහ 7 වන මාස සඳහා පුරෝකථිත විකුණුම් ගණනය කරන්න.

(ලකුණු 05)

(ii) සාතිය සුමටන ක්‍රමය (exponential smooting) භාවිතයෙන් 4, 5, 6 සහ 7 වන මාස සඳහා පුරෝකථිත ඉල්ලුම ගණනය කරන්න.
(3 වන මාසය සඳහා පුරෝකථිත ඉල්ලුම 61 සහ ඇල්පා අගය 0.3 ලෙස සලකන්න.)

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

අ) පහසුකම් ස්ථානගත කිරීමේ තීරණ සඳහා සලකා බැලිය යුතු සාධක 05 ක් සඳහන් කරන්න.

(ලකුණු 05)

ආ) පහසුකම් ස්ථානගත කිරීමේ තීරණ ගැනීමේ පියවරයන් විස්තර කරන්න.

(ලකුණු 05)

ඇ) සංකාර්ය කළමනාකරණය තුල ගෝලීයකරණයේ වාසි සහ අවාසි 5 බැගින් සඳහන් කර ඒවා සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 06**

අ) බිම්සැලසුම් වර්ග 4 ක් හඳුනාගෙන ඒවායේ ලක්ෂණ විස්තර කරන්න.

(ලකුණු 05)

ආ) ක්‍රියාවලි බිම් සැලසුම සඳහා උදාහරණයක් ලෙස දේශීය ව්‍යාපාරයක් ගෙන පැහැදිලි කරන්න. ඔබ සඳහන් කරන ලද ව්‍යාපාරයේ දෙපාර්තමේන්තු ස්ථානගත කරන ආකාරය රූපානුසාරයෙන් පෙන්වන්න.

(ලකුණු 05)

ඇ) එකලස් මඟක ඉටුකලයුතු කාර්යයන් අනුපිළිවෙලින් පහත වගුවේ සඳහන් කර ඇත. පැය 08 ක වැඩ මුරයකදී නිපදවිය යුතු ඒකක ගණන 400 කි.

| කාර්යය | කාර්ය කාලය තත්ත්පර | ආසන්නතම පෙර කාර්යය |
|---|---|---|
| A | 25 | නැත |
| B | 60 | A |
| C | 35 | B |
| D | 45 | B |
| E | 10 | B |
| F | 50 | C,D,E |

(i) ඉහත කාර්යයන් සඳහා ක්‍රියාකාරකම් ජාලය ගොඩනගන්න.

(ii) අපේක්ෂිත නිමවුම් අනුපාතයට ලඟාවීම සඳහා අදාල චක්‍රීය කාලය තත්ත්පරවලින් ගණනය කරන්න.

(iii) න්‍යායාත්මකව පැවතිය යුතු අවම වැඩ මධ්‍යස්ථාන ගණන කොපමණද?

(iv) එකිනෙක වැඩ මධ්‍යස්ථානයට කුමන කාර්යයන් පැවරිය යුතුද යන්න දක්වන්න.

(v) මාර්ගයෙහි කාර්යක්ෂමතාවය ගණනය කරන්න.

(එක් කොටසකට ලකුණු 02 බැගින්)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 07

අ) ක්‍රම අධ්‍යනය යනු කුමක්ද? එහි අරමුණු මොනවාද?

(ලකුණු 05)

ආ) වැඩ මැනීම යනු කුමක්ද? එහි අරමුණු මොනවාද?

(ලකුණු 05)

ඇ) එක්තරා ක්‍රියාවක කාර්ය කොටස් කිරීමට ගතවන කාලය මිනිත්තුවලින් පරීක්ෂණයක් මගින් පහත ආකාරයට වාර්තා කර ඇත.

| කාර්ය කොටස | නිර්ක්ෂණය හෙළිවූ චක්‍රීය කාලය | | | | | | කාර්ය සාධන අනුපාතය |
|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | |
| A | 1.10 | 1.08 | 1.15 | 1.16 | 1.07 | 1.10 | 95 |
| B | 3.00 | | 2.20 | | 3.10 | | 90 |
| C | 0.92 | 0.88 | 0.85 | 0.88 | 0.90 | 0.94 | 105 |
| D | 1.23 | 1.30 | 1.26 | 1.33 | 1.28 | 1.30 | 100 |
| E | 1.46 | 1.64 | 1.55 | 1.52 | 1.62 | 1.60 | 85 |
| F | 1.80 | 1.78 | 1.76 | 1.80 | 1.82 | 1.10 | 110 |

(i) එක් එක් කාර්ය කොටස් සඳහා නිරීක්ෂිත මධ්‍ය කාලය ගණනය කරන්න.

(ලකුණු 02)

(ii) එක් එක් කාර්ය කොටසට අදාල සාමාන්‍ය කාලය ගණනය කරන්න.

(ලකුණු 02)

(iii) ක්‍රියාව සඳහා කාල දීමනා සාධකය 15% යැයි සලකා එක් එක් කාර්ය කොටසට අදාල ප්‍රමත කාලය ගණනය කරන්න.

(ලකුණු 03)

(iv) ක්‍රියාව සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ප්‍රමත කාලය ගණනය කරන්න.

(ලකුණු 03)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 08

අ) සමස්ථ සැලසුම් කිරීම (aggregate planning) යනු කුමක්ද? එහි ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) ද්‍රව්‍ය අවශ්‍යතා සැලස්මක් (MRP) යනු කුමක්ද? පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ) JIT සංකල්පයේ වැදගත්කම එහි භාවිතයන් යොදාගනිමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**